# කැලණි රජ මහා විහාරස්ථානයේ සිවුරු ගල ස්ථාපනය කෙරේ



බුදු රජාණන් වහන්සේ තෙවැනි වතාවට ලංකාවට වැඩම කරන ලද අවස්ථාවේදී කැලණි ගඟට බැස ස්නානය කරන ලද බවට විශ්වාසයක් පවතින අතර සිවුර පසෙකින් තබන ලද ගල අනාවරණය කරගෙන එම ස්ථානය ආරක්ෂා කරන විශේෂ මන්දිරයක් ස්ථාපිත කර තිබේ. කැලණිය රජ මහා විහාරාධිපති මහාචාර්ය මහින්ද සංඝරක්ඛිත හිමියන් විසින් එම පිහිටුවීමේ ඓතිහාසික වැදගත්කම උරුමයක උල්පත නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතාට විස්තර කළ අවස්ථාව ඡායාරූපයේ දැක්වෙයි. දායක සභාවේ නියෝජිත පද්මසිරි හපන්ගම මහතා ද මෙම අවස්ථාවට සහභාගී විය. එම්.එම්. බී.එල්. පාත්ෆයින්ඩර් සමූහ ව්‍යාපාරයේ ඉදිකිරීම් හා නඩත්තු අංශය මෙහි නිර්මාණය හා සම්පූර්ණ ඉදිරිකිරීම් නිම කරන ලද අතර අවශ්‍ය ප්‍රතිපාදන බස්නාහිර පළාත් සභාව සහ විහාරස්ථාන දායක සභාව වැය කරන ලද බව සඳහන්ය. කැළණිය රජ මහා විහාරස්ථානයට පැමිණෙන බැතිමතුන්ට කැලණි ගඟ අසබඩ අලුතින් ස්ථාපනය කර ඇති මෙම පූජා භූමියට ද ප්‍රවේශ විය හැකිය.

| ගාමිණී සරත් ගොඩකන්ද